# 18 දිසාපති කාමරේදීය

## මොනිකා රුවන්පතිරණ (1946-2004)

මොනිකා රුවන්පතිරණ යනු 70 දශකයේ කවීන් අතර වූ ප්‍රකට ම කිවිඳියයි. 1971 දී **අපි දෙන්නා සහ තවත් කිහිප දෙනෙක්** නම් කාව්‍ය සංග්‍රහය නිකුත් කරමින් කාව්‍ය ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වූ මොනිකා රුවන්පතිරණ **තහනම් දේශයකින්** (1972), **ඔබේ යෙහෙළිය ඇය ගැහැනිය** (1975), **අංගුලිමාලගේ සිහින** (1979), **විසි වසක ශේෂ පත්‍රය** (1992), **අසන් පත්තිනි දේවතාවී** (1999), **හිපොක්‍රටිස් සහ රෝගිනිය** (2003) සහ **අලුත් ම සිහිනය** (2003) යන කාව්‍ය ග්‍රන්ථ ඔස්සේ ස්වකීය කාව්‍ය ප්‍රතිභාව ප්‍රකට කළාය. කෙටිකතා රචිකාවක මෙන් ම, සාහිත්‍ය විචාරිකාවක ද වූ ඇය ස්ත්‍රිය වෙනුවෙන් හඬක් නැගූ කිවිඳියකි.

පවත්නා සමාජ ක්‍රමය තුළ කළල අවස්ථාවේ සිට වියපත් ව මියැදෙන තුරු ස්ත්‍රියකට අත් විඳීමට සිදු වන අනේකවිධ අසාධාරණකම් පිළිබඳ හඬ නගමින් ස්ත්‍රියගේ ඉරණම ප්‍රශ්න කිරීම උදෙසා ඇය ස්වකීය කවිය මෙහෙය වූවා ය.



කාව්‍ය අන්තර්ගතයෙහි වන සර්වකාලීන අගය, පොදු බව, හද සසල කරවීම, ඍජු සමාජ බලපෑම හේතුවෙන් ඇගේ කවිය වඩාත් ප්‍රබල ලෙස සහෘද හද සසල කරයි. පත්වෙයි. ගජමන් නෝනාගෙන් පසු බිහි වූ ප්‍රශස්තම කිවිඳිය මොනිකා රුවන්පතිරණය යන්න බොහෝ විචාරකයන්ගේ මතයයි.

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස
එ සඳ ඔබේ මුව 'ග නැගුණු සාද තෙපුල් නැසේ මට

මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයා දී රකිමින
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඬුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි නොදැනේ

එක යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමට ද ඔබගේ අවසර?

## ලිඛිත අභ්‍යාස

1. 'දිසාපති කාමරයේ දී ය' නිර්මාණයට පාදක වී ඇති අත්දැකීම පැහැදිලි කරන්න.

2. චිත්ත රූප මැවෙන භාෂාවක් යොදා ගනිමින් තම අදහස ගම්‍ය කිරීමට කිවිඳිය දැරූ උත්සාහය 'දිසාපති කාමරයේ දී ය' පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.

3. 'දිසාපති කාමරයේ දී' සාර්ථක පද්‍ය පන්තියක් ලෙස අගය කළ හැක්කේ කෙසේදැයි විමසන්න.